රුහුණ විශ්වවිද්‍යාලය
**2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 2000 ස්ථලය**
**පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්**

**GEO 21653 - ගෝලීයකරණය : ශ්‍රී ලංකාවේ පැතිකඩ**

ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.

**කාලය : පැය 03 යි.**

---

01. "ගෝලීයකරණය යනු බහුවිධ සමාජ ආර්ථික ප්‍රවාහයන් ඔස්සේ ගෝලීය ඒකාබද්ධතාව හා අන්තර්පරායක්තතාව ඇති කරන ක්‍රියාවලියකි." නිදසුන් දක්වමින් මෙම ප්‍රකාශය විමසන්න.

(ලකුණු 15)

02. ලෝක පද්ධති න්‍යාය හෙවත් හර - පර්යන්ත ආදර්ශකය මඟින් ගෝලීයකරණයේ බලපෑම හඳුනා ගැනීමට ලැබෙන දායකත්වය විමසන්න.

(ලකුණු 15)

03. යටත්විජිතවාදය, කාර්මික විප්ලවය සහ බහු ජාතික සමාගම් යන ත්‍රිත්වයෙන් ගෝලීයකරණයේ ඉතිහාසය නිරූපණය වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

04. සංස්කෘතික ගෝලීයකරණය (Cultural Globalization) යන්න හඳුන්වා දී, එය පර්යන්ත කලාපීය රටවලට බලපෑම් කරන ආකාරය නිශ්චිත නිදසුන් සහිත ව විභාග කරන්න.

(ලකුණු 15)

05. මානව සංක්‍රමණය (Human Migration) පුළුල් වීමෙහි ලා ගෝලීයකරණය දක්වන පිටු බලය ශ්‍රී ලංකාව කෙරෙහි සුවිශේෂ අවධානය යොමු කරමින් විග්‍රහ කරන්න.

(ලකුණු 15)

06. ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්තිය (Protectionist Trade Policy) හේතු කොට ගෙන පර්යන්ත කලාපීය රටවල් මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

07. 1970 දශකයෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක පැතිකඩ තුළ ඇති වූ වෙනස්කම් සමාජය ගෝලීයකරණය වීම හේතු කොට ගෙන සිදු වූයේ ද යන්න දත්ත සහිත ව විමර්ශනය කරන්න.

(ලකුණු 15)

@@@@@@@@

52